# චිත්ත පරීක්ෂණ හා ලෝකය

පොල් ගෙඩි හෝ වෙනත් වස්තු හෝ පොළොවට වැටීම එක් එක් සංස්කෘතීන්හි එක් එක් වකවානුවල සිටින ජනයා දකින්නේ එකම ආකාරයකට නොවන බව අපි කලින් දුටුවෙමු. මෙහි දී අවබෝධකර ගතයුතු ප්‍රධානම කරුණ නම් වස්තු පොළොවට වැටෙන්නේය යනුවෙන් සංසිද්ධියක් එක් එක් අය එක් එක් කාලවල විවිධ අයුරින් වටහාගැනීමක් නොසිදුවන බව ය. එසේ සංසිද්ධියක් විවිධ අයුරින් අර්ථ නිරූපණය කළහැකි ය යන්නෙන් කියැවෙන්නේ එලෙස නිරපේක්ෂව ගතහැකි සංසිද්ධියක් ඇති බව හා ඒ සංසිද්ධිය එක් එක් අයට සාපේක්ෂව විවිධ ආකාරයෙන් නිරීක්ෂණයවන බව ය. එලෙස සංසිද්ධියක් ඇතැයි ගැනීම ආත්මවාදී වෙයි. අප බොහෝ දෙනා, ඇතැම්විට ථෙරවාද බුදුදහමෙහි විශාරදයන් ලෙස ජනතාවගේ ගෞරවයට පාත්‍රවී සිටින අය පවා, ඇතැම් කරුණුවලදී ආත්මවාදී ස්ථාවරවලට පැමිණ ඇති බව පෙනෙන්නට ඇත. ඉතා පරීක්ෂාකාරී නොවුවහොත් තාවකාලිකව හෝ ආත්මවාදීවීම නො වැළැක්වියහැකි ය.

පොළොවට පොල් වැටීම යන්න ද අපේ නිර්මානයක් වෙයි. පොල් යන සංකල්පය ද අපේ නිර්මානයක් වෙයි. එහි ඇති වාස්තවිකත්වයක් නැති බව ඉංගිරිසියෙන් පොල් යනුවෙන් සංකල්පයක් නොමැතිවීමෙන් ම පැහැදිලි වෙයි. ඒ ඒ ප්‍රදේශවල ජනයා එදා තමන්ට අදාළ ආකාරයට දැනුම නිර්මානය කළහ. අද අපට එසේ කිරීමට ඉඩ නෙදෙන්නේ ද වාස්තවිකත්වය, යථාර්ථය වැනි සංකල්ප උපයෝගීකරගනිමින් ය. මේ සංකල්ප යටත්විජිතවාදී සංකල්ප ලෙස හැඳින්විය යුතු අතර ඒ යොදාගන්නන් යටත්විජිතවාදීන් ලෙස හඳුනාගත යුතු යැයි සිතමි. ඊනියා වාස්තවික දැනුම නිර්මානයකිරීම බටහිරයන්ට භාරදී අපි ඔවුන්ගෙන් ලැබෙන දැනුම් කටු පමණක් සුප්පුකරමින් සිටිමු.

පොල් වැටීම යනුවෙන් අපෙන් ස්වායත්ත වූ දැනුමක් නොමැති වුව ද අපි ඒ සම්මුතියෙන් ගනිමු. එලෙස පොල් හෝ වස්තු හෝ වැටීම සම්මුතියක් ලෙස ගැනීමෙන් පසුව පෙනී යන කරුණ නම් ඒ සම්මුතිය ද ඉන්පසු විවිධ උපසම්මුතීන්වලට වෙන්කෙරී ඇති ආකාරය ය. ඇරිස්ටෝටලීය උපසම්මුතිය, ගැලීලීය උපසම්මුතිය, නිව්ටෝනීය උපසම්මුතිය, අයින්ස්ටයිනීය උපසම්මුතිය යනු බටහිරයන් සකස්කරගෙන ඇති උපසම්මුති හතරක් වෙයි. ඒ ඒ කාලවල බටහිර උගතුන්ගෙන් පිරිසක් ඇපල් වැටීම දැක ඇත්තේ හෝ දකින්නේ හෝ ඒ ඒ උපසම්මුතිය ආධාරකරගනිමින් ය.

එක් උපසම්මුතියකින් වෙනත් උපසම්මුතියකට මාරුවීමේ දී සිදුවන්නේ කුමක් ද? ඒ සඳහා සෑම විටම නව පරීක්ෂණ අවශ්‍ය වන්නේ ද? නිව්ටන් පඬිවරයා කළ පරීක්ෂණය කුමක් ද? ඔහු ඇපල් ගෙඩියක් (අප ඇපල් ගෙඩිය යැයි කීව ද ඉංගිරිසින් ඇපල් ගෙඩි යනුවෙන් ව්‍යවහාර නොකරන බව අමතක නොකළ යුතු ය. ඔවුහු apple යන සංකල්පයෙහි ඇපල් ගෙඩිය යන්න ද ඇතුල්කරති.) උඩ දමා ඒ වැටෙන්නේ කෙසේ දැයි බැලීමට පරීක්ෂණයක් නො කෙළේ ය. ඔහු කෙලේ නිදැල්ලේ ත්වරණයකින් වැටෙන ඇපල් ගෙඩිය ගුරුත්වාකර්ෂණබලයක් යටතේ වැටෙන්නක් බවට පත්කිරීම ය. නිව්ටන් පඬිවරයා ද එක් අතකින් ගත්කල කෙලේ චිත්ත පරීක්ෂණයකි. ඔහුගේ සිතෙහි නිව්ටෝනීය චලිත නියම විය. මේ චලිත නියමවලට අනුව ඊනියා අවස්ථිති සමුද්දේශ රාමුවක වස්තුවක් ත්වරණයකින් චලනය වනුයේ ඒ මත බලයක් යෙදෙන්නේ නම් ය. නිව්ටන් පඬිවරයාට ඇපල් ත්වරණයකින් පොළොවට වැට්ටවීම සඳහා බලයක් අවශ්‍ය විය. ඔහු ඒ බලය නිර්මානය කෙළේ ය. ඒ නිර්මිත බලය ගුරුත්වාකර්ෂණ බලය විය.

අයින්ස්ටයින් පඬිවරයා වෙනත් ආකාරයකට සිතුවේ ය. ඔහුට නිදැල්ලේ වැටෙන වස්තු ඇත්තට ම නිදැල්ලේ වැටෙන වස්තු විය. එනම් එවැනි වස්තු මත යෙදෙන බලයක් නොමැති විය. නිදැල්ලේ වැටෙන පොල් ගෙඩියක් මත බලයක් නො යෙදෙන්නේ නම් එය ත්වරණයකින් චලනය වනුයේ කෙසේ ද? ඒ ප්‍රශ්නයට පිළිතුර අයින්ස්ටයින් පඬිවරයාගේ චිත්ත පරීක්ෂණයෙහි විය. ත්වරණයකින් ගමන් කෙරෙන රොකට්ටුවේ සිටින විද්‍යාඥයා අතහරින වස්තුවක් නිදැල්ලේ චලනය වන්නේ වුව ද, අදාළ විද්‍යාඥයා සිතන්නේ වස්තුව ත්වරණයකින් “පහතට” වැටෙන බව ය. විද්‍යාඥයා වස්තුවේ චලිතය විස්තරකිරීමට බලයක් නිර්මාණයකරයි. අයින්ස්ටයින් පඬිවරයා අමුතුවෙන් පරීක්ෂණයක් නොකළ බව සැබෑ ය. එහෙත් ඔහු තම චිත්ත පරීක්ෂණය ඔස්සේ නව විවරණයක් සැපයී ය. නව විවරණයක් යනු නව දැනුම

© Prof. Nalin De Silva

ය. දැනුම යනු ලෝකය විවරණය කෙරෙන ආකාරය වෙයි. ලෝකය යනු ලෝකය පිළිබඳ නිර්මානය කෙරෙන දැනුම මිස අන් කිසිවක් නො වෙයි. චිත්ත පරීක්ෂණයක් ඔස්සේ ද දැනුම නිර්මානය වෙයි.
නව දැනුම සඳහා චිත්ත නොවන පරීක්ෂණම අවශ්‍ය යැයි කියන්නන්ට අනුව තිබෙන ප්‍රවාද විශ්ලේෂණයකිරීමෙන් නව දැනුමක් නිර්මානයකිරීමට නො හැකි ය. ඔවුන්ගේ පළමුවැනි උපකල්පනය වනුයේ දැනුම යනු නිර්මානයකරන්නක් නොවන බව ය. ඔවුන් කියන්නේ දැනුම අපට ලැබෙන්නේ අපේ ඉන්ද්‍රිය ඔස්සේ බව ය. මනසෙන් තොරව පවතින ලෝකයක් පිළිගන්නා ඔවුහු ඒ ලෝකයෙන් ඉන්ද්‍රිය ඔස්සේ ලැබෙන සංඥා මගින් දැනුම ලැබෙතැයි විශ්වාසකරති. නව දැනුමක් ලැබෙන්නේ ලෝකයෙන් පමණක් යැයි සිතන ඔවුහු ඒ සඳහා ලෝකයෙන් සංඥා අපේක්ෂාකරති. එහෙත් ඔවුන් නොසිතන කරුණ නම් ඊනියා සංඥා ද අපේ ම නිර්මාන බව ය. සංඥාවක්, සංඥාවක් බවට පත්වන්නේ මනසක් ඇති මිනිසුන්ට මිස මනස් නොමැති යන්ත්‍රවලට නො වෙයි.

පාටක්, පාටක් ලෙස හඳුනාගන්නේ අප ය. ශබ්දයක්, ශබ්දයක් ලෙස හඳුනාගන්නේ අප ය. ඔය කියන සංඥා කැමරාවකට ද ලැබුණ ද කැමරාව අහවල් පාට ය, අහවල් දීප්තිය ය යනුවෙන් සංඥාවක් ඇතිකර නො ගනියි. සංඥාවක් යනු අපට ලැබෙන දෙයක් නොව අප ලබාගන්නා දෙයක් ය. සංඥාවේ ඊනියා ලැබීම යන්න අපට ද කැමරාවට ද පොදු ය. කිරණ යැයි අප හඳුන්වන දෑ අපේ ඇස්වලට මෙන් ම කැමරාවේ ඇසට (කාචයට) ද ලැබෙයි. එහෙත් කැමරාව  සංඥාව ලබා නො ගනියි. එයට හේතුව කැමරාව සංඥාවක් නිර්මානය නො කිරීම ය. එහෙත් අපි සංඥාවක් නිර්මානය කරමු.

ලෝකය ගැන කෙරෙන පරීක්ෂණ මගින් නව දැනුම ලබාගැනීමට බලා සිටින්නෝ  දැනුම ද සංඥා මෙන් ම අප වෙත ලැබෙන්නේ යැයි සිතති. එහෙත් මුළු ලෝකය ම අපේ නිර්මානයක් වන කල්හි අපට සංඥා පමණක් අපේ මැදිහත් වීමක් නොමැතිව ඇති නො වෙයි. චිත්ත පරීක්ෂණයක දී නව පර්යේෂණයක් නො කෙරුණ ද, නව අර්ථකථනයක් සිදුවෙයි. නව දැනුම යනු අපේ මනස විසින් නිර්මානය කෙරෙන දෙයක් මිස මනසට පිටින් ලැබෙන දෑ නො වෙයි. එබැවින් දැනුම නිර්මානයෙහි දී චිත්ත පරීක්ෂණයක් වුව ද කම් නැත. වෙනත් වචනවලින් කියන්නේ නම් චිත්ත පරීක්ෂණවලින් ද නව දැනුම් නිර්මානයකිරීමට හැකි ය.

මෙහි දී කිවයුතු තවත් කරුණු දෙකක් වෙයි. පළමුවෙන් ම සඳහන් කළයුත්තේ අනෙක් අයට වඩා චිත්ත පරීක්ෂණ යොදාගත් අයින්ස්ටයින් පඬිවරයා මනසින් තොර බාහිර ලෝකයක පැවැත්ම ඉතා තදින් විශ්වාසකළ අයකු වීම ය. ඔහු සිතන්නට ඇත්තේ චිත්ත පරීක්ෂණ හරහා තමා බාහිර ලෝකය සිතෙහි නිර්මානයකරන බව විය හැකි ය. එහෙත් එහි දී කෙරෙනුයේ බාහිර ලෝකය යැයි සිතා සිටින යමක් සිතෙහි මවා ගැනීම මිස අනෙකක් නො වෙයි. රොකට්ටු, ත්වරණ, රොකට්ටුවේ සිටින විද්‍යාඥයා ආදී මේ සියල්ල මනස විසින් නිර්මානය කෙරෙන සංකල්ප වෙයි. ඒ සංකල්ප යොදාගනිමින් මනසෙහි තව තවත් සංකල්ප නිර්මානය කිරීම නොකළ හැකි එකක් නො වෙයි.

දෙවනුව සඳහන් කළ යුත්තේ පශ්චාත්නූතනවාදීන් බොහෝ විට ගුරුකොටගන්නා වාග්විද්‍යාඥයකු වූ සොසුර්ගේ සංඥාවේදය ඔහු උපකල්පනයකරන කරුණුවලින් බොහෝ ඈතින් තිබෙන බව ය. වෙනත් බටහිර ප්‍රධාන ධාරාවේ බුද්ධිමතුන් මෙන් ම ඔහු ද මනසින් බාහිර වූ ලෝකයක  පැවැත්ම උපකල්පනය කරයි. ඒ බාහිර ලෝකයෙන් නිරීක්ෂකයා වෙත ලැබෙන සංඥා ඇතැයි ඔහු විශ්වාසකරයි. ඒ ලැබෙන සංඥා ඔහු විසින් හඳුන්වාදෙනු ලැබ ඇත්තේ සංඥායක (signifier) ලෙස ය. සොසුර්ට අනුව ඒ සංඥායක විසින් නිරූපණය කෙරෙන සංඥායිතයක් (signified) වෙයි. එසේ වුව ද මේ සංඥායිතය සංස්කෘතියෙන් ස්වායත්ත නොවන බව ඔහු පවසයි. මේ බව කලින් ද සඳහන්කර ඇති නමුත් නැවත කියන්නේ නම් ඉන් ප්‍රකාශවන්නේ සිංහලයන්ගේ පොල් ඉංගිරිසින්ගේ කොකනට් ම නොවන බව ය. පොල් යනු කොකනට්හි සෘජු පරිවර්තනයක් නො වෙයි. සොසුර් මෙහි දී යොදාගන්නා උදාහරනය අශ්වයා ය. ඔහු පවසන්නේ ඉංගිරිසින්ගේ අශ්වයා (horse) ප්‍රංශ ජාතිකයන්ගේ අශ්වයාගෙන් වෙනස් බව ය. එසේ වුවත් ඒ සියළු අශ්වයන්ගෙන් ඔබ්බෙහි ඇති යථාර්ථවාදී අශ්වයකු ඇතැයි ද සොසූර් උපකල්පනය කරයි.

සංඥායිතය සංස්කෘතිය මත රඳාපැවතී සංඥායකය සංස්කෘතියෙන් ස්වායත්තවිය නො හැකි ය. අනෙක් අතට සංඥායකය හා සංඥායිතය යනුවෙන් කොටස් දෙකකට බෙදීම සංකල්පයක් සම්බන්ධයෙන් ගත්කල අප අවුලකට

© Prof. Nalin De Silva

පත්කරයි. පොල් යැයි ශබ්ද නගා කී කළ යම් සංඥාවක් ලැබේ යැයි සොසුර් පවසයි. එහෙත් ඒ ශබ්දය සමග ම අපට පොල් යන සංකල්පය ද ඇතිවෙයි. පොල් යන ශබ්දය ඇසී මොහොතකට (ඒ කෙතරම් කුඩා වුව ද) අපට පොල් යන සංකල්පය ඇතිවනවා නො වෙයි. එබැවින් පොල් ශබ්දය හා පොල් සංකල්පය යනුවෙන් දෙකකට කැඩීම ම සංකල්පීය වශයෙන් වුව ද නිවැරදි නො වෙයි. පොල් යනුවෙන් ශබ්දයක් ඇති බව සැබෑ නමුත් එයින් යමක් හැඟවෙන්නේ ශබ්දය, ශබ්දයක් ලෙස වෙනම ගැනීමෙන් නො වෙයි.

එහෙත් මෙයින් කියැවෙන්නේ සංකල්පයකට වුව ද සන්දර්භයකින් තොර පැවැත්මක් ඇතැයි යන්න නො වෙයි. උපාසකම්මා යන වචනය ගනිමු. ඒ වචනය වෙනත් වචන සමග සම්බන්ධ නොවී ඇසුණහොත් හෝ ලියාතිබෙනු කියවුවහොත් හෝ ඒ සමග අපට ලැබෙන්නේ ගුණවත් සිල්වත් ස්ත්‍රියක පිළිබඳ අදහසක් ය. එසේ වුවත් ඒ වචනය ඇතැම්විටක වෙනත් වචන සමග සම්බන්ධ වී යම් සන්දර්භයක ඇසෙනවිට හෝ කියැවෙනවිට හෝ වෙනත් අර්ථයක් ජනිතවීමට හැකි ය. උදාහරණයක් ලෙස එයා හොඳ උපාසකම්මා යැයි කියුවහොත් ඉන් ජනිතවන්නේ සිල්වත් ගුණවත් ස්ත්‍රියක පිළිබඳ අදහසක් නො වෙයි.

චිත්ත පරීක්ෂණවල යොදාගත්ත ද අනෙක් පරීක්ෂණවල යොදාගත්ත ද අපට ඇත්තේ මනසින් නිර්මානයකරන ලද සංකල්ප ය. ඒ සංකල්ප චිත්ත රූප ලෙස පමණක් යොදා ගත්ත ද එහි ද මනසට හා සංස්කෘතියට වූ සාපේක්ෂකත්වයක් වෙයි. සංකල්ප වචන ලෙස යොදාගැනෙන කල්හි ඒ වචනවල සංස්කෘතික බලපෑම ඉතා පැහැදිලි ය. එපමණක් නො වෙයි. ඒ වචන සන්දර්භය අනුව ද වෙනස් වෙයි. ශබ්දයක් යනුවෙන් මනසෙහි සංකල්ප පසුව ඇතිකරන ශබ්ද නැත. ශබ්ද තේරුමක් දෙන්නේ, නැත්නම් මනස ශබ්දවලට තේරුමක් දෙන්නේ සංස්කෘතියක හා සන්දර්භයක ය. සංස්කෘතිය ද සන්දර්භයක්වන බැවින් මනසෙහි නිර්මානයකරන හෝ නිර්මානයකෙරෙන සංකල්පවල ඇත්තේ සාපේක්ෂබවක් ය. චිත්ත පරීක්ෂණවලින් මෙන්ම අනෙක් පරීක්ෂණවලින් ද කෙරෙන්නේ සංකල්ප ආශ්‍රයෙන් ලෝකය නිර්මානයකිරීමට මගපෑදීමක් මිස මනසෙන් තොරව පවත්නා ලෝකයක් තේරුම්ගැනීම නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva